CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

2024 දෙසැම්බර් 03

සීමාසහිත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (ගැරන්ටි)
6/5, ලෙයාර්ඩ්ස් පාර,
කොළඹ 05,
ශ්‍රී ලංකාව.

ගරු හර්ෂණ නානායක්කාර මහතා,
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍ය,
නො.19,
ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

මහත්මයාණෙනි,

ජනාධිපතිවරණයෙන් සහ පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසුව, ජාතික ජන බලවේගය (NPP) වෙත ශ්‍රී ලංකාවේ ජනතාව විසින් සැලකිය යුතු ජනවරමක් ලබා දී ඇති අතර, මහජන විශ්වාසය, විනිවිදභාවයෙන් යුත් පාලනය, යුක්තිය සහ වග වීම යළි ස්ථාපිත කිරීම සඳහා ප්‍රධාන ප්‍රතිසංස්කරණ ගෙන ඒමේ අවස්ථාව ඔබ හුමුවට ගෙනඑනු ලැබ ඇත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) වෙනුවෙන් මවිසින්, **යුක්තිය සහ ජාතික ඒකාග්‍රතාවය යන ක්ෂේත්‍ර තුළ ඇති නෛතික සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ කෙරෙහි ඔබගේ හදිසි අවධානය යොමු කර සිටිමි.**

රාජ්‍ය ආයතන කෙරෙහි විශ්වාසය දැඩි ලෙස පලුදු කර ඇති දූෂණයට එරෙහි ව තීරණාත්මක ක්‍රියාමාර්ග සඳහා දීර්ඝ කාලීන මහජන ඉල්ලීම් සහ වගකීම් නොමැතිකම පිළිබඳ ව අවධානය යොමු කරමින්, විස්තීරණ පාලන ප්‍රතිසංස්කරණවල තීරණාත්මක අවශ්‍යතාවය අරගලය විසින් අවධාරණය කරන ලදි. මෙම සන්දර්භය තුළ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ අනෙකුත් පංගු පාර්ශවකරුවන් විසින් නැවත නැවතත් වැඩි විනිවිදභාවය සහ වග වීමෙහි අවශ්‍යතාවය, විධායක සීමාවන් ඉක්මවා යාම, ආයතන දේශපාලනීකරණය කිරීම සහ දණ්ඩමුක්තියේ මුල් බැසගත් සංස්කෘතිය වැනි ගැටලු විසඳීමේ හදිසි අවශ්‍යතාවය අවධාරණය කරන ලදි.

එපමණක් නොව, ගැටුමට තුඩුදුන් හේතූන් ආමන්ත්‍රණය කිරීමට අනුප්‍රාප්තික රජයන්ට ඇති නොහැකියාව සහ අකමැත්ත හේතුවෙන් සමාජ බෙදීම් ඇති වීම, නිරීක්ෂණ තීව්‍ර වීම, පවතින ගැටුම් වර්ධනය වීම සහ නව ආතතීන් ඇති වීමේ අවදානම වැඩි වීම යන කරුණු තවදුරටත් වර්ධනය වී ඇත. විශේෂයෙන් සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ 2024 ඔක්තෝම්බර් සහ දෙසැම්බර් අතර කාලය තුළ අවස්ථා කිහිපයක දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) භාවිතා කිරීම මගින් ජාතික ජන බලවේගයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ඇතුළු පීඩාකාරී නීති අවලංගු කිරීමට ප්‍රතිඥා දීම යන ක්‍රියාකලාපයන් ප්‍රශ්නගත වේ.

මැතිවරණ ප්‍රචාරක කාලසීමාව තුළ දුන් පොරොන්දු සහ ප්‍රතිසංස්කරණ සඳහා වූ දැවැන්ත ජනවරම සැලකිල්ලට ගනිමින් ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම ඉතා වැදගත් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරයි. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලීන් හැඩගැස්වීමේ දී විනිවිද පෙනෙන ආකාරයෙන් විවිධ පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීමේ වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණය කරයි. විවිධ පර්යලෝකයන් සැලකිල්ලට ගන්නා සහයෝගී ප්‍රවේශයන් සහ ඉදිරි දර්ශන මගින් ප්‍රතිසංස්කරණ මුලපිරීම්වල සඵලතාවය සහ තිරසාර බව සැලකිය යුතු ලෙස ඉහළ නැංවිය හැක.

මේ සම්බන්ධයෙන්, මැදිහත්වීම් අවශ්‍යතාව පවතින්නේ යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විශ්වාස කරන ක්ෂේත්‍ර කිහිපයක් මෙම ලිපියට අමුණා ඇත. මෙම ක්ෂේත්‍රයන්, **(1) පාලනය සහ වග වීම, (2) නීති සම්පාදනය, (3) සංහිඳියාව සහ (4) නෛතික ප්‍රතිසංස්කරණ සහ ව්‍යුහාත්මක අසමානතා ආමන්ත්‍රණය කිරීම** ලෙස සිව් හැකිලුම් රාමුවක් යටතේ වර්ගීකරණය කර ඇත.

ඉදිරි ව්‍යවස්ථාදායක සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය තුළ මැදිහත්වීම් සඳහා මෙම ක්ෂේත්‍රවලට ප්‍රමුඛත්වය දෙන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඔබේ අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින අතර එමගින් සියලු පුරවැසියන්ගේ අභිලාෂයන් පිළිබිඹු කෙරෙන යුක්තිය පසිඳලීමේ පද්ධතිය ගොඩනැගීමට කඩිනම් පියවර ගනු ඇතැයි ද බලාපොරොත්තු වේ. මෙම කරුණු තවදුරටත් සාකච්ඡා කිරීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත දෙනු ලබන අවස්ථාවක් සාදරයෙන් පිළිගන්නා අතර අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට අපගේ අඛණ්ඩ සහයෝගය ද ලබා දෙනු කැමැත්තෙමු.

ඔබගේ ප්‍රතිචාරය සහ අධිකරණ ක්ෂේත්‍රයේ පරිවර්තනීය ක්‍රියාමාර්ග සඳහා ධනාත්මක පියවර දැකීමට බලා සිටිමු.

මෙයට විශ්වාසී,

ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු
විධායක අධ්‍යක්ෂක

**නීතිමය සහ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ අවශ්‍ය මැදිහත්වීම්**

| **පාලනය සහ වග වීම** | |
|---|---|
| **අධිකරණයේ ස්වාධීනත්වය ශක්තිමත් කිරීම** | • ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පත්වීම් ලබා දීමේ දී ජනාධිපතිවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුගමනය කළ යුතු නිර්ණායක නියම කිරීම.<br>• පුද්ගලයන් විනිසුරුවරුන් ලෙස පත් කිරීමට නාමයෝජනා දීමේ දී විනිවිදභාවයෙන් යුත් නිර්ණායක ජනාධිපතිවරයා විසින් අනුගමනය කරන බවට සහතික විය යුතු ය.<br>• ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා අනුමත කරනවා ද නැද්ද යන්න තීරණය කිරීමේ දී කවුන්සිලය විසින් යොදාගන්නා ලද ක්‍රියාවලිය සහ නිර්ණායක සඳහා පාදක වන රීති සංවර්ධනය කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දිරිමත් කිරීම.<br>• ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණයෙන් විනිසුරුවරුන් ඉවත් කිරීම සඳහා පැහැදිලි සහ සාධාරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය. |
| **රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලය** | • වග වීම සහතික කිරීම සඳහා රජයේ ස්වාධීන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීම.[1] |
| **සංකේතාත්මක නඩුකර** | • මහජන විශ්වාසය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා විනිවිදභාවයෙන් යුත් විමර්ශන සහ ඉහළ පෙළේ සිද්ධීන් සම්බන්ධයෙන් වග වීම සහතික කිරීම ඉතා වැදගත් වේ. පාස්කු ඉරිදා ප්‍රහාරය සහ තවත් සංකේතාත්මක සිද්ධීන් සම්බන්ධයෙන් පරීක්ෂණ කඩිනම් කිරීම ද ඊට ඇතුළත් ය.[2] |
| **දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම** | • ශක්තිමත් අන්‍යෝන්‍ය නීති සහායක (MLA) රාමුවක් ස්ථාපිත කිරීම සහ 2019-2022 දක්වා එහි අපේක්ෂිත ඉල්ලීම් ආමන්ත්‍රණය කිරීම.<br>• සිවිල් රාජසන්තක කිරීම සහ අභියාචන සැකසුම් යාන්ත්‍රණය වැනි අලුතින් ලබා ගත හැකි නීතිමය සංකල්ප ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන් ම මෙම සංකල්ප වර්තමානයේ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත හරහා නීත්‍යානුකූල ව පිළිගෙන ඇත.[3] |

---

[1] පැහැදිලි ක්‍රියාකාරී කරුණු සහිත පහත ලේඛනය බලන්න: "Rethinking Attorney General's Department in Sri Lanka: Ideas for Reform" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්). https://www.cpalanka.org/wp-content/uploads/2020/11/AGs-Dept-Final.pdf

[2] "Elusive Justice and Emblematic Cases in Sri Lanka" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2023 මාර්තු). https://www.cpalanka.org/wp-content/uploads/2023/04/Elusive-Justice-and-Emblematic-Cases-in-Sri-Lanka-Book-Online-Version-1.pdf

[3] "Advocacy Report on Understanding Interconnections between Human Rights and Economic Crimes in Sri Lanka: Exploring Issues and Potential Ways Forward" (විකල්ප

<table>
<tr><td colspan="2">නීති සම්පාදනය</td></tr>
<tr><td>නීති සම්පාදන ක්‍රියාවලිය</td><td><ul><li>ශ්‍රී ලංකාවේ නීති සම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු ආමන්ත්‍රණය කිරීම, ඒවාට ඇතුළත් වන්නේ:<ul><li>ව්‍යවස්ථාදායක ක්‍රියාවලියේ විනිවිදභාවය වැඩි දියුණු කිරීම, විශේෂයෙන් ම පනත් කෙටුම්පතක් ගැසට් කිරීමට පෙර මහජනතාවගේ එකගත්වය සහතික කිරීම.</li><li>ඉතා ගැඹුරු සමාලෝචනයක් සඳහා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක 1 වන 2 වන කියවීම් අතර සාකච්ඡා කාලය දීර්ඝ කළ යුතු වේ.</li><li>පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූල අනුකූලතාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාලෝචනය කළ යුත්තේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කළ අවසන් පෙත්සම ගොනුකළ දින සිට සති 3ක් ඇතුළත ය.</li><li>නීති සම්පාදනය කිරීමෙන් පසු අධිකරණ සමාලෝචනය සහතික කරන ව්‍යවස්ථා සංශෝධනය.</li></ul></li></ul></td></tr>
<tr><td colspan="2">සංහිඳියාව</td></tr>
<tr><td>නියම අයිතිකරුවන් හට ඉඩම් ආපසු ලබා දීම</td><td><ul><li>ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් ස්ථාපිත කරන ලද ඉඩම් සම්බන්ධ ප්‍රතිපත්ති සහ පළාත් සභාවලට වැඩි ස්වාධීනත්වයක් පවරා ඇති 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම.</li><li>උතුරු හා නැගෙනහිර පළාත්වල අත්පත් කර ගැනීම් සම්පූර්ණ කර නොමැති සියලු ම පෞද්ගලික ඉඩම් ආපසු ලබා දිය යුතු වේ.</li><li>අසාධාරණ ලෙස අත්පත් කරගත් ඉඩම් නැවත ලබා දීම සහ පසුගිය දශක කිහිපය තුළ රාජ්‍ය ඉඩම් අත්පත් කර ගැනීම් හේතුවෙන් අහිතකර ලෙස බලපෑම් ඇති වුවන් සඳහා විස්තීර්ණ වන්දි පැකේජයක් ලබා දීම.</li><li>ඉඩම් අත්පත් කර ගැනීමේ සෑම අවස්ථාවකදී ම 2001 දී ශ්‍රී ලංකාව විසින් සම්මත කරන ලද ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය (NIRP) පිළිපැදීම.</li><li>‘පොදු අරමුණක්’ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම් සමාලෝචනය කර විනිවිදභාවය සහ වග වීම සහතික කිරීම. මිනිසුන්ට සහ පරිසරයට හානිකර සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ ව රේඛීය අමාත්‍යාංශ විසින් ප්‍රමාණවත් විමර්ශනයක් සහතික කිරීම.[4]</li></ul></td></tr>
<tr><td>දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම</td><td><ul><li>කිසිදු චෝදනාවකින් තොරව දීර්ඝ කාලයක් රඳවාගෙන සිටින පුද්ගලයන් නිදහස් විය යුතු ය.</li></ul></td></tr>
</table>

ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 මාර්තු). https://www.cpalanka.org/wp-content/uploads/2024/03/Economic-Crimes-Advocacy-Report.pdf

[4] The Intersectional Trends of Land Conflicts in Sri Lanka (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 අගෝස්තු), https://www.cpalanka.org/the-intersectional-trends-of-land-conflicts-in-sri lanka/#:~:text=CPA%20recognises%20a%20series%20of,making%20objectives%20of%20private%20entities.

| | |
|---|---|
| | ● අපරාධ නඩුවල දී භාවිතා කළ යුතු එකම සාක්ෂිය ඔවුන්ගේ ම පාපොච්චාරණ වන අවස්ථාවන් සමාලෝචනය කළ යුතු අතර, එවැනි පුද්ගලයින් නිදහස් කළ යුතු ය.<br>● ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට අනුව ඔහුගේ ම පාපොච්චාරණය මත පමණක් පුද්ගලයා වරදකරු කර ඇති අවස්ථා සමාලෝචනය කර සමාව ලබා දීම. |
| **අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය(OMP) සහ සමූහ මිහිදන් කිරීම්** | ● OMP හට ප්‍රමාණවත් අරමුදල් ඇතුළු ව දේශපාලන ඇඟිලි ගැසීම් වලින් ආරක්ෂා වී ස්වාධීන ව ක්‍රියා කළ හැකි බව සහතික කර ගැනීම.<br>● OMP හි විධිනියෝගවල පූර්ණ චිරස්ථිතිය ඉදිරියට ගෙන යාමේ දී කොමසාරිස්වරුන් පත් කිරීම සහ ස්වාධීනව කටයුතු කිරීමට හැකි කාර්ය මණ්ඩල බඳවා ගැනීම.<br>● OMP සතුව සමූහ මිහින්දන් කිරීම්, කැණීම් සහ ගොඩගැනීම් සඳහා දායක විය හැකි විශේෂිත අධිකරණ වෛද්‍ය කණ්ඩායමක් සංවර්ධනය කිරීමට අවශ්‍ය සම්පත් ඇති බව සහතික කිරීම සහ මහේස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ බලය ඇති ව දේහයන් හඳුනා ගැනීමට මූලික වගකීම ගැනීම.<br>● අධිකරණ වෛද්‍ය නිලධාරී (JMO), රජයේ රස පරීක්ෂක සහ වෙනත් අය ඇතුළු ව රජයේ සමස්ත අධිකරණ වෛද්‍ය පරීක්ෂණ ධාරිතාව සහ විශේෂඥතාව ශක්තිමත් කිරීම. |
| **සත්‍ය සහ ප්‍රතිසන්ධානය** | ● ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය (ONUR) හරහා වින්දිතයන්ගේ කනස්සල්ල සහ ඒ සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රයත්නයන් අව්‍යාජ ඒවා ද යන්න පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් පවතින බැවින් ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන කාර්යාලය මගින් සිදුවන එම ක්‍රියාදාමයන් සමාලෝචනය කළ යුතු වේ.<br>● ක්‍රියාමාර්ග අවශ්‍ය ක්ෂේත්‍ර පැහැදිලි ලෙස සපයා ඇති සංහිඳියා යාන්ත්‍රණයන් පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකායේ වාර්තාව ඇතුළු ව පවතින සාහිත්‍යයන් සමාලෝචනය කළ යුතු වේ. |
| **නීති ප්‍රතිසංස්කරණ සහ ව්‍යුහාත්මක අසමානතා ආමන්ත්‍රණය කිරීම** | |
| **1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත (PTA) සහ ත්‍රස්තවාදයට එරෙහි පනත් කෙටුම්පත** | ● ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි වර්තමාන ස්වරූපය ඉවත් කිරීම සහ අවශ්‍ය වේ නම් එය එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් පිළිබිඹු වන ජාත්‍යන්තර ත්‍රස්ත විරෝධී ප්‍රමිතීන්ට අනුකූල නීත්‍යානුකූල ලේඛන සහ තුලනාත්මක ව්‍යවස්ථාමය භාවිතයන් සමඟ ප්‍රතිස්ථාපනය කිරීම.<br>● අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණ සිදුවන තෙක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත භාවිතා කිරීම වහාම තාවකාලික ව අත්හිටුවීම අවශ්‍ය වේ. |
| **2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත සහ යෝජිත සංශෝධන** | ● 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත අවලංගු කර බහුවිධ පංගු පාර්ශවකරුවන්ගේ විවිධ දෘෂ්ටිකෝණයන් සැලකිල්ලට ගැනෙන සහ විනිවිදභාවයෙන් යුතු ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් අනවශ්‍ය කඩිනමකින් තොර ව ආරම්භ කළ යුතු වේ.[5] |

[5] "Statement on the Online Safety Act No. 09 of 2024" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2024 පෙබරවාරි). https://www.cpalanka.org/statement-on-the-online-safety-act-no-09-of-2024/

| | |
|---|---|
| **රාජ්‍ය නොවන සංවිධානවලට අදාළ යෝජිත රෙගුලාසි සම්බන්ධයෙන් සැලකිලිමත් වීම** | ● නීති ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීමේ දී විනිවිද පෙනෙන සහ සහයෝගිතාවයෙන් යුත් ක්‍රියාවලියක් ආරම්භ කර එය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව පවතින බව සහතික කළ යුතු ය. |
| **1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත** | ● කොමිෂන් සභාවේ තීරණ ගැනීම සඳහා පනතේ 11 වැනි වගන්තිය යටතේ කොමිසමට පැවරී ඇති බලතල රාජ්‍ය බලධාරීන්ට එරෙහි ව ක්‍රියාත්මක කළ හැකි පරිදි සංශෝධනය කළ යුතු වේ. |
| **2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය** | ● 2007 අංක 56 දරන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 3 වැනි වගන්තිය අවලංගු කළ යුතු වේ. |
| **මැතිවරණ නීති සම්බන්ධ ප්‍රතිසංස්කරණ** | ● පවතින නීති වල හිඩැස් ආමන්ත්‍රණය කළ යුතු වේ.. නිදසුනක් වශයෙන්, 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත යටතේ වැරදි අදාළ වන්නේ තනි අපේක්ෂකයන්ට මිස නීතිය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයේ භාෂාව සමඟ නොගැළපෙන දේශපාලන පක්ෂවලට නොවේ. තවද, මැතිවරණ කොමිසමට අසත්‍ය තොරතුරු වාර්තා වුවහොත් ඒ සම්බන්ධයෙන් පුද්ගලයන් රඳවා තබා ගැනීම සහ ඔවුන්ගේ වග වීම පිළිබඳ මැතිවරණ කොමිසමට තාක්ෂණික හැකියාවක් නොමැත. ප්‍රතිලාභ වාර්තා කිරීමේ දී මහජන සහ සිවිල් සමාජ ආයතනවලට ඒවා අභියෝගයට ලක් කිරීමට උසාවිය තුළ නීතිමය අවස්ථාවක් නොමැත. එනම් මැතිවරණ පෙත්සම් සම්බන්ධයෙන් උසාවිය ඉදිරියේ පෙනී සිටීමේ හැකියාව තනි අපේක්ෂකයන් හට පමණක් සීමා වී ඇත.<br>● සංක්‍රමණික සේවකයන්ගේ ඡන්ද බලය පිළිගැනීම සඳහා නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීම. සංක්‍රමණික සේවකයන්ට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ/කොන්සල් කාර්යාලයේ ලියාපදිංචි වීමට ක්‍රමයක් හඳුන්වා දීම සහ ඔවුන්ට ඒ හරහා මැතිවරණ වේලාවේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට ඉඩ සලසන ක්‍රමයක් හඳුන්වා දීම මෙයට ඇතුළත් වේ.<br>● ජනාධිපති, පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ සඳහා අත්‍යවශ්‍ය සේවා හා රාජ්‍ය නිලධාරීන් හට විශේෂ ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම සහතික කිරීම සඳහා අදාළ නීති රාමුව සංශෝධනය කළ යුතු වේ. |
| **1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත ප්‍රතිසංස්කරණය කිරීම (සංශෝධිත ලෙස)** | ● මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (MMDA) ප්‍රතිසංස්කරණවලට ප්‍රමුඛත්වය දී කාන්තාවන් සහ ළමුන්ගේ අයිතිවාසිකම් තහවුරු කළ යුතු වේ. |

| | |
|---|---|
| **ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සම්බන්ධ ව පවතින නීති ප්‍රතිසංස්කරණය කිරීම** | ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සම්බන්ධයෙන් පවතින දණ්ඩ නීති පරීක්ෂා කර යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය.[6] මෙයට ඇතුළත් වන්නේ:<br>● වින්දිතයාට නිසි ආරක්ෂාවක් ලබා දීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ ස්ත්‍රී දූෂණ වරද ප්‍රතිසංස්කරණය කළ යුතු ය.<br>● ගබ්සා කිරීම් නිර්-සාපරාධීකරණය කළ යුතු වේ.<br>● ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365A වගන්තිය ඉවත් කළ යුතු වේ. එමෙන් ම පුද්ගලිකත්වය සහ නිදහස සඳහා වන අයිතිවාසිකම්වලට ගරු කරන බව සහතික කළ යුතු අතර විශේෂයෙන් ම පුද්ගලික ව කැමැත්තෙන් වැඩිහිටියන් අතර සිදුවන ලිංගික ක්‍රියා සාපරාධී නොවන බවට තහවුරු කළ යුතු ය.<br>● වින්දිතයින්ට ලබා දී ඇති ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ පනත සංශෝධනය කළ යුතු ය.<br>● SGBV හි මාර්ගගත ආකාරයෙන් සිදුවන දෑ ප්‍රමාණවත් ලෙස විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට නව නීති හඳුන්වා දීම.<br>● වින්දිතයින්ගේ කම්පනය සහ පුනර්ජීවනය අවම කරන SGBV සඳහා ඉක්මන් සහ පුද්ගලික නඩු පැවරීමට ඉඩ සලසන පරිපාටිමය නීති යාවත්කාලීන කළ යුතු වේ.<br>● 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත ප්‍රතිසංස්කරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br>● SGBV වින්දිතයන් සමඟ නිසි ලෙස කටයුතු කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ නඩු පවරන්නන්ට පුහුණුව ලබා දීම.<br>● SGBV හි වින්දිතයින් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පැමිණිලි යාන්ත්‍රණයක් සකස් කළ යුතු වේ.<br>● ශ්‍රී ලංකාවේ SGBV හි ඉහළ අනුපාතවලට මූලික හේතු විමර්ශනය කිරීම සහ මෙම සිදුවීම් වැළැක්වීමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.<br>● ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් ව පුද්ගලයන්ට හිරිහැර කිරීමට සහ රඳවා තබා ගැනීමට තුඩු දෙන පාදඩ ආඥාපනත ප්‍රතිසංස්කරණය කළ යුතු වේ. |

[6] "Legal Reform to Combat Sexual and Gender based Violence" (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2020 නොවැම්බර්). https://www.cpalanka.org/wp-content/uploads/2020/11/Law-Reform-to-combat-SGBV-PART-1-General-Centre-for-Policy-Alternatives.pdf